# බ්‍රිතාන්‍ය යුගයේ වර්ධනය වූ කැරලි පිළිබඳ විග්‍රහයක්

**අජිත් තල්වත්ත**
B.A - M.A. (පේරාදෙණිය)

යටත් විජිත සමාජයක ජාතිවාදයේ ස්වභාවය ගැන අවධානය යොමු කිරීමේදී '' ප්‍රතික්‍රියාවන්'' ඉතා වැදගත් වේ. යටත් විජිත වාදයට එරෙහිව පාලිත සමාජය කරනු ලබන නැගී සිටීම ප්‍රතික්‍රියාවන් ලෙස හඳුනාගත හැකිය. මෙය ඉතාමත්ම සංකීර්ණ ක්‍රියාවලියකි. එයින් ඉතා වැදගත් කොට පෙන්විය හැකි වන්නේ අරගල සම්ප්‍රදායයි. මෙම ලිපිය මඟින් අවධාරණය කරනු ලබන්නේ අරගල සම්ප්‍රදාය ගැන ඉතිහාසකරණයේ ඇති මතවාද හඳුනාගෙන යටත් විජිතවාදයට එරෙහිව 1798,1818,1848 දී සිදුවූ අරගල (කැරලි) පිළිබඳ විමසා බැලීමකි.

ඉතිහාසකරණයේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ලිබරල් ඉතිහාසකරණයට අයත් සම්ප්‍රදායයි. මෙමගින් සිදුවන්නේ යටත්විජිතවාදය තුළින් ලෝකය පුරා බටහිර ධනවාදයත්, බටහිර දේශපාලන ව්‍යුහය මත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයත් ව්‍යාප්ත වීමයි. මෙම තත්ත්වය 19 වන සියවසේ මුල් කාලයේ සිටම දක්නට ලැබුණි. බටහිර ධනේශ්වර පන්තියේ ආකල්පයන් උද්දීපණය කරමින් රචනා වූ මෙම ඉතිහාසකරණ සම්ප්‍රදායේ දක්නට ඇත්තේ අපක්ෂපාතී මතවාදයන් නොව පක්ෂග්‍රාහී ඉතිහාසකරණ සම්ප්‍රදායකි. 19 වන සියවසේ මුල් කාලය වනවිට බටහිර ධනේශ්වර පන්තිය සමාජයේ ප්‍රබල පිරිසක් බවට පත්විය. ඔවුන්ගේ අපේක්ෂාවන් අනුව යටත් විජිත වාදය සාධාරණීයකරණය සඳහා වැඩි උත්සාහයක් ගන්නා ලදි. මෙම සම්ප්‍රදාය මෑතක්වනතුරුම යටත්විජිත සමාජවල ඉතිහාසය ලිවීමේදී මූලික ලෙස අනුගමනය කරණු ලැබේ. එනුමත් එය මූලික වශයෙන් ප්‍රශ්න කිරීමට භාජනය වන්නේ පශ්චාත් නූතනවාදී චින්තනය වර්ධනය වීම තුළින්, පශ්චාත් යටත් විජිතවාදී චින්තනයේ ආරම්භවීමත් සමඟය. මෙම සම්ප්‍රදාය යටතේ ලියූ පොතක් ලෙස Ranagith guha ගේ "Dominance Without Hegemony" ඉතා වැදගත් වේ.

බ්‍රිතාන්‍ය යටත්විජිතවාදය ආරම්භවන්නේ කඩුවේ ආධාරයෙන් බව පශ්චාත් නූතනවාදීන් පෙන්වාදුන්නත් ලිබරල් ඉතිහාසකරණය තුළ එවැනි මතවාදයන් දක්නට නොලැබේ.. ආසියානු යටත්විජිතවල ආධිපත්‍ය පිහිටුවීමේදී කල්පනා කිරීමකින් තොරව බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ගොඩනැගූ බවට තර්කයක් ඉදිරිපත් කරමින් යටත්විජිතවාදය සාධාරණීයකරණය සිදුකර තිබේ. රනජිත් ගුහා ඉදිරිපත් කරන ව්‍යුහය ගැන කථාකරන විට ඉතිහාසකරණයත් යටත්විජිතවාදයත් අතර කිට්ටු සබඳතාවක් ඇත. එබැවින් ඉහතින් පෙන්වා දුන් ආකාරයට ඉතිහාසකරණයේ දක්නට ඇත්තේ ධනේශ්වර පන්තියේ ආකල්පයන් මුදුන්පත්කර ගැනීමකි. සෑම සංවාදයකම බල ව්‍යුහයක් ඇති අතර, එය මෙහෙයවනු ලබන්නේ සිය වරප්‍රසාද ආරක්ෂා කරගැනීමට හැකිවන අයුරෙනි.

යටත්විජිතවාදයේ පීඩනය නිසා ජනතාව ප්‍රතික්‍රියා දැක්වීම වැදගත් ක්‍රියාදාමයකි. මෙයිනුත් ඉතා වැදගත්වන්නේ යටත්විජිත විරෝධී අරගලයන්ය. යටත්විජිත ඉතිහාසකරණයේ විශේෂ ලක්ෂණය වන්නේ ගැමි අරගල එතරම් වැදගත් නොවන බව සාමාන්‍යයෙන් පිළිගැනීමයි. අරගල යටත්විජිතවාදය තුළ ඇති වූ සුළු සුළු කරදර මිස යටත්විජිතවාදයට තර්ජනයක් නොවූ බව පෙන්වයි. මෙම පසුබිම තේරුම්ගත් රනජිත් ගුහා විසින් (Subaltern School) සාමාන්‍ය ජනතාව ගෙනගිය අරගල වල වැදගත්කම හුවා දැක්වීමට උත්සාහ ගනු ලැබීය. නූතනය වනවිට එය යටත්විජිතවාදයේ වැදගත් තේමාවක් බවට පත්වී තිබේ. යටත්විජිත ඉතිහාසකරණයේ ගැමි කැරලි වලට පහත් තැනක් ලබාදීමට ප්‍රධාන හේතු 02 ක් විය.

i. යටත්විජිත පාලකයින් වී අරගල වලට වැදගත් තැනක් නොදීම මඟින් ඒවා මර්ධනය කිරීමට දැඩි ක්‍රියා මාර්ග ගැනීම සාධාරණීය කරණය කිරීම.
ii. දේශීය ප්‍රභූ පන්තිය යටත්විජිත විරෝධී ව්‍යාපාරයේ ප්‍රභූ නායකත්වය හා ප්‍රභූ ආධිපත්‍ය හුවා දැක්වීමට ගැමි අරගලවලට නිසි තැනක් නොදීම.

19 වන සියවසේදී ලංකාවේ ඇතිවූ අරගල සම්ප්‍රදාය බලන විට ඉතිහාසකරණයෙන් ඉතා වැදගත් තැනක් හිමිකර දී නොමැත. විශේෂයෙන්

1796, 1818 කැරලි පිළිබඳ මඳ අවධානයක් යොමුකර ඇත. 1818 කැරැල්ල කෙරෙහි විශේෂ අවධානයක් යෙමුකරණු ලැබුවේ නම් බ්‍රිතාන්‍යයන්හට උඩරටින් යාමට පවා සිදුවන්නේ ය. ජාතික ව්‍යාපාරය ගැන ලියන කොටස් 1848 කැරැල්ල එතරම් වැදගත් ලෙස නොසලකන අතර ඉතිහාසයෙහි ඒ සඳහා සුළු තැනක් ලබාදී තිබේ.

බටහිර ඉතිහාසකරණය දෙස අවධානය යොමු කරන විට හෝක්ස් බෝන් සහ ජෝර්ජ් රූඩ් විසින් යටත්විජිතවල ඇතිවූ අරගල ප්‍රාථමික කැරලි ලෙස හඳුන්වති. රොබින්හුඩ්, සරදියෙල් වැනි අය ප්‍රාථමික කැරලිකරුවන්ය. 1820 ගණන් වනවිට එංගලන්තයේ සීඝ්‍ර කාර්මිකරණයත් සමග කෘෂිකාර්මික සමාජයේ මෙතෙක් පැවති සාමකාමීභාවය බිඳවැටී නව යන්ත්‍ර සූත්‍ර ආදේශයත් සමග සමාජයේ පැවැත්ම සංකීර්ණ වන්නට විය. මෙම තත්වයයට එරෙහිව කැප්ටන් ස්ටූවට්ගේ නායකත්වය යටතේ කැරලි ඇති වී කර්මාන්තශාලාවල තිරිඟු අඹරණ යන්ත්‍ර විනාශකරන අතර, තිරිඟු වලට හානි නොකරයි. තිරිඟු ඔවුන් හට යැපීම සඳහා අවශ්‍යවන ප්‍රධාන ධාන්‍යයකි. ධාන්‍ය විනාශ කළහොත් පාඩුව අත්විමට සිදුවන්නේ ජනතාවටමය. එනමුත් බටහිර ඉතිහාසකරණය මඟින් මෙම කැරලි දකින්නේ සැහැල්ලුවෙන් සහ ප්‍රාථමික ආකාරයෙනි.

බටහිර ලිබරල් චින්තනය තුළින් ඉදිරිපත්වන අදහසක් වන්නේ සෑම පුරවැසියකුම රාජ්‍යයක සාමාජිකයෙකු බවයි. ඒ අනුව ඔහුට අයිතිවාසිකම් හා යුතුකම් ඇත. රාජ්‍ය වෙනුවෙන් බදු ගෙවීම් ආදී දෑ වගකීම් ලෙස පෙන්වා දිය හැකිය. ඔහුට ඇති අයිතිවාසිකම් හඳුනාගැනීමේදී දේශපාලන බලය ඒකාධිපති ක්‍රමයට යනවා නම් ඊට විරුද්ධව කටයුතු කිරීමට ජනතාවට අයිතියක් ඇත. එංගලන්තයේ උත්කෘෂ්ඨ විප්ලවය මඟින් ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් රජවරුන්ගේ හිතුවක්කාර පාලනයට එරෙහිව ක්‍රියාකිරීමට හැකි ඉඩ ප්‍රස්ථාව උදාවිය. ලංකාවේ බ්‍රිතාන්‍යයන්ගේ පාලනය විඳදරා ගැනීමට නොහැකි වනවිට එයට එරෙහිව ක්‍රියාත්මක වීමට පුරවැසියන්ට අයිතියක් නැති අතර, යුතුකම් පමණක් යටත් විජිත රජය වෙනුවෙන් ඉටුකළ යුතුය.

මෙම තත්ත්වය තුළ කෙසේද අරගල ඇති විය හැක්කේ, යම් යම්

උද්ඝෝෂණ කළත් දේශපාලන අරගල කිරීමට ඔවුනට හැකියාවක් නොවීය. රජතුමා ධාර්මිකව කටයුතු නොකරණවිට ඔහුව බලයෙන් නෙරපීමට අතීතයේ සිටම ජනතාවට අයිතියක් තිබුණි. යටත්විජිතවාදය ආරම්භ වීමත් සමග පුරාණයේ සිට ජනතාව අපේක්ෂා කළ ධාර්මික පාලනය ගැන සිතයි. එය අහිබවා ගියවිට මිනිසුන් කැරලි ගැසීමට පෙළඹෙයි. එම නිසා මෙම කැරලි දේශපාලන කැරලි නොවේ යැයි දැක්වීමට නොහැකිය. එම කැරලි ඇති වන්නේ යම්කිසි පදනමක් තුළ සිට වුවත්, යටත්විජිතවාදය තුරන් කිරීමට හැකියාවක් නොමැත. කැරලි කරුවන් කැරලි ඇතිකර යම් ක්‍රියාමාර්ගවලට පෙළඹුනත් සෑම දෙයක්ම විනාශ නොකරයි. තර්කානුකූලව සිතාබලා කටයුතු කළ නිසා ඒ තුළ දේශපාලන දැක්මක් නොවූ බව පිළිගත නොහැකිය. විශේෂයෙන්ම පෘතුගීසි අවධියේදී පන්සල්, දේපල අයිතිකරගෙන පල්ලියට හා රදළයන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා ලබාගනී. එනමුත් පීඩනය වැඩිවත්ම ජනතාව පල්ලියට පහර නොදෙන අතර, පූජකයාගේ ගෙදර විනාශ කරයි. මෙයින් පැහැදිලි වන්නේ ඉතිහාසකරණය මඟින් මෙහි දේශපාලන දැක්මක් නැති බවට ප්‍රකාශ කලත්, කැරලි කරුවන්ගේ ක්‍රියාකාරකම් තුලින් එහි පැහැදිලි දේශපාලන ආකල්ප දකින්නට ලැබුණ බවයි. ලිබරල් ඉතිහාසකරණය පිළිබඳ අදහස් දැක්වූ හොක්ස් බෝන්, රූඩි වැනි අය ප්‍රකාශ කරන්නේ කැරලිවලට සම්බන්ධ වූ අයගේ පැහැදිලි දේශපාලන දැක්මක් නොවූ බවයි. එහෙත් එම මතවාදයන් පිළිගැනීමට තරමක් දුරට අපහසුය.

ඉතිහාසකරණයේ කැරලි සම්ප්‍රදාය තුළ පැහැදිලි නායකත්වයක් නොවූ බව පෙන්වා දේ. එමුත් මේ කැරලි විග්‍රහ කිරීමේදී පෙන්වාදෙන දෙයක් වන්නේ ඒ ඒ අවස්ථාවේ කැරැල්ලේ ස්වභාවය අනුව නායකත්වය බිහිවේ. පුද්ගල තරාතිරම මත නොව ඔවුන්ගේ කැපවීම මත නායකත්වය බිහිවේ. ඒ නිසා කලින් හඳුනාගත් නායකයින්ට වඩා ක්ෂණිකව පත්වූ නායකයින් මේ කැරලිවල දක්නට ලැබේ. ලංකාවේ කැරලිවල මෙන්ම ප්‍රංශ විප්ලවය අවධියේ මිනිසුන් ඉදිරියට තල්ලුවී නිර්භීතව හා කැපවීම මත නායකත්වය බිහිවේ. මෙම කැරලිවල දේශපාලන දැක්මත් පැවති බව මනාව පැහැදිලි වන්නේ කැරැල්ල අතරතුර නාමමාත්‍රික රජ කෙනෙකු හඳුනාගනී. නමුත් එමඟින් රාජාණ්ඩු ක්‍රමයකට නොයන නිසා කැරලිකරුවන් දේශපාලන අරමුණු නොමැති අය ලෙස හැඳින්විය නොහැකිය. මෙම ලක්ෂණය යටත්විජිත සමාජයන්හි දක්නට ලැබේ. නොයෙක්

කැරලිවල සම්ප්‍රදායික නායකත්වයක් ගැන සිතීමක් නොමැත. ඒ වෙනුවට නොයෙක් අරමුණු පෙරටුකොටගෙන පැවති සමාජ, ආර්ථික, රටාව නැවත ස්ථාපිත කිරීමට උත්සාහ ගනී. එය කැරැල්ල විසින් විනාශ කිරීමට උත්සාහ කරන යටත්විජිත ආධිපත්‍ය තරම් පීඩාකාරි නැති බව අවබෝධකර ගනී. එවැනි අවබෝධයක් පැවති බවට සාක්ෂි පවතින බැවින්, කැරලිකරුවන්ට දේශපාලන විඥානයක් නැතැයි පිළිගත නොහැකිය.

කැරලි ගැන ඉතිහාසකරණය මඟින් පවත්වනු ලබන තවත් මතවාදයක් වන්නේ එහි කිසිදු සැලසුම්කරණයක් නොමැතිව ක්ෂණිකව වර්ධනය වුවක් ලෙසය. මෙහිද එතරම් සත්‍යයක් නැත. කැරලිකරුවන් නොයෙක් ආකාරවලින් තමන්ගේ පීඩනයට හේතුවන පුද්ගලයා හෝ ආයතන වෙනස් කිරීමට, ඒ සඳහා වගකිවයුතු පුද්ගලයන් සමග සාකච්ඡා කිරීමට උත්සාහ ගනී. එවා නොයෙක් ආකාරයේ දුක්ගැනවිලි පෙත්සම්, උද්ඝෝෂණ මඟින් ඉදිරිපත් කරයි. එමඟින් තමන් අපේක්ෂා කරන සාධාරණත්වය නොලැබෙන විට ජනතාව කැරලි ගැසීමට පෙළඹේ. නමුත්, අරගලයට යොමුවීමට පෙර තමන්ගේ සමාජයේ සම්ප්‍රදායික නායකයන්ගෙන් සම්ප්‍රදායික ආයතන (ගම් සභා, වරිග සභා, ග්‍රාමීය පන්චායත්) සමග සාකච්ඡා කරයි. පාලන ව්‍යුහය භාවිතාකර තමන්ගේ දුක්ගැනවිලි වලට සාධාරණත්වයක් අපේක්ෂා කරයි.

මෙසේ විකල්ප ක්‍රමයක් මෙන්ම, ආර්ථික කටයුතු ගැන කථාකිරීමත් කැරලිවලට පෙර දක්නට ඇත. මෙහි අපට පැහැදිලිවම දැකිය හැකිවන්නේ යටත්විජිත විරෝධී වැඩ පිළිවෙලක් නොමැතිකමයි. යටත්විජිත ආධිපත්‍ය දුර්වල කිරීමට අවශ්‍ය කෙබඳු වැඩ පිළිවෙලක් ද, ජයගත් පසු ගනුලබන ක්‍රියාමාර්ග ගැන සැලසුම් කරයි. එබැවින් ග්‍රාමීය අරගල දේශපාලන වශයෙන් වැදගත්කමක් නැති සිදුවීම් ලෙස සැලකීම යුක්ති සහගත නැත. එම මතවාදයන් සිතෙහි තබාගෙන ලංකාවේ ඇතිවූ අරගල සම්ප්‍රදාය පිළිබඳ හඳුනාගැනීමක් කළ යුතුය. වර්ෂ 1796 පෙබරවාරි මස 16 දින පෙරදිග ඉන්දිය වෙළඳ සමාගමේ හමුදාව විසින් ලන්දේසීන් සතුව ලංකාවේ තිබූ ප්‍රධාන බලකොටුව වූ කොළඹ සියතට ගන්නා ලදි. යටත්වීම පිළිගැනුනේ දෙපක්ෂය අතර, ඇතිවූ ගිවිසුමකින් පසුවය.[1] ඊට සමගාමීව සෙසු යටත් විජිතයන්ද අත්පත් කර ගත්තේය. පෙරදිග ඉන්දිය

වෙළඳ සමාගම හෙවත් ජෝන් සමාගම යටතට ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ නතුකළ අවස්ථාවේ දී සමාගම විසින් යුධ පාලන ක්‍රමයක් පිහිටුවිය[2]. එහි පාලනයෙහි ප්‍රධානියා වූ ශාන්ත ජෝජ් බලකොටුවේ ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් මුහුදුබඩ පළාත්වල පාලනය ගෙනයනු ලැබීය[3]. මෙසේ මදුරාසි පාලනයට ඈඳාගත් නිසා විධිමත් පාලනයක් පිහිටුවීමට උත්සාහයක් නොකැරිණි.

ඉංග්‍රීසීන් විසින් ලන්දේසීගෙන් අත්පත් කර ගැණුනු ලංකාවේ ප්‍රදේශ කොයි මොහොතේ වුවද ආපසු ඔවුනට පවරන්නට පුළුවන් බව සැළකූ පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම ඒ පෙදෙස් අත්හැර ගනුවස් ඔවුන් දැරූ වියදම එවැනි පැවරීමකට පෙර ලබාගනු පිණිස සෑම උත්සාහයක්ම ගත්හ[4]. ඒ අනුව මදුරාසි සිවිල් සේවයෙහි සාමාජික රොබට් ඇන්ඩෲස් මහතා අයබදු පිළිබඳ සුපිරින්ටැන්ඩන්ට් තැන වශයෙන්ද එහිම සාමාජික ජෝන් ජාවිස් මහතා ඔහුගේ සහකාරක වශයෙන්ද පත් කරනු ලැබූහ[5]. ගම් වැසියන්ගේ භාෂාවන් හෝ චාරිත්‍රයන් නොදත් ඔවුන් ශතවර්ෂාධික කාලයක් මෙහි පැවති පෘතුගීසීන් හා ලන්දේසීන් විසින් සම්පූර්ණයෙන් හා කොටස් වශයෙන් ගෙන ක්‍රියාත්මක කළ අයබදු පිළිබඳ සම්ප්‍රදායන් කිසිසේත් නොදත්හ. ඔවුන් නවක ලෙසින් මදුරාසියේ පැවති ක්‍රමය හඳුන්වාදෙනු ලැබීය. දිසාපති, මුදලි, විධානේ ආදී නිළධාරීන්ගෙන් සමන්විත පුරාණයේ සිට මෙහි පැවති අධිපති ක්‍රමය මෙරට නැතිකිරීම සඳහා පියවර ගත්හ[6]. රජයෙන් ලබාගත් ඉඩම් වගා කිරීමෙන් දිවිරැකගත් සෑම රටවැසියෙක්ම අවුරුදුපතා නියමිත සේවයක් රජයට කැරෙන ලෙස හෝ තමා ඉපයූ අස්වැන්නෙන් කොටසක් රජයට ගෙවන ලෙස හෝ බලකැරෙන වැඩවසම්ක්‍රමය රාජකාරිය යන චිරාගත සම්ප්‍රදායයන් ක්‍රියා විරහිත කළහ[7]. රජයට නිසැක ආදායම් ලැබූ මාර්ගයන් මෙසේ වසා දැමූ ඔවුහු ඇග, මාලු, ලුණු, අරක්කු, රා, දුම්කොළ, මැණික් ගැරීම, කැස්බෑවන් ඇල්ලීම සම්බන්ධයෙන් බදු පැනවිය. මේ බදු සියල්ල මුදලින් ගෙවිය යුතු විය. මෙසේ පැනවූ අයබදු සියල්ල මුදලින් ගැනීමට පහසුවන පරිදි කොළඹ, ත්‍රිකුණාමලය හා යාපනය නමින් ආදායම් පළාත් තුනකට ඉංග්‍රීසී රජය විසින් කඩා වෙන් කරන ලදි.

ඉහත ලෙස පැනවූ අයබදු එකතු කිරීමේ කාර්ය පැවරුණේ මදුරාසියෙන් ගෙන්වනු ලැබූ සිවිල් නිළධාරීන් වෙතය. ඔවුන්ගේ කාර්යාලයන්

හැඳින්වීමට ''කච්චේරිය.'' යන හින්දු නාමය ව්‍යවහාර කරණු ලැබීය. මෙසේ සේවය කිරීම සඳහා පැමිණි පිරිස අවුමිල්ඩාර්, කොට්වාල්, ගුමස්ටා යනාදී විදේශීය නාමයන්ගෙන් හැඳින්වූහ. මෙම නිළධාරීන්ගේ ක්‍රියාකාරිත්වය නිසා ඉතාමත් කෙටි කාලයකින් ලංකාවේ අවුල් වියවුල් ඇති වීමට හේතු විය. මදුරාසි නිළධාරීන් යුධ හා සිවිල් කටයුතුවලට වැඩ බැලීමත් සමග දේශීය පාලන කටයුතු ගෙන ගිය මුදලිවරුන්ගේ බලතල අඩු කිරීමට පියවර ගනුලැබීය. බදු රැස්කිරීම, වාද විවාද, අරගල සන්සිඳවීම, වැරදිකරුවන්ට දඬුවම් පැමිණවීම, ඕලන්ද නිළධාරීන්ගේ ආඥා ක්‍රියාවට නැංවීම, රටෙහි සිදුවන දෑ ඔවුනට දන්වා යැවීම යනාදි සේවයන් මුදලිවරුන් හරහා සිදුවිය[8]. ඔවුන් වෙත විශාල බලයක් තිබුනි. මුලාදෑනි පාලනය වූ කලී රාජ්‍යක් ඇතුලත පැවති තව රාජ්‍යක් හා සමාන වූවක් විය. රාජ්‍ය පාලනයට මේ මුදලිවරු මහත් බාධකයක් වෙතැයි මදුරාසි ආණ්ඩුව කල්පනා කළේය. ඔවුන් තනතුරින් පහකර රාජ්‍ය සේවයේ වේතන වශයෙන් ලබා තිබුණු නින්දගම් ලබා නොදුන්නේය. මෙම පසුබිම නිසා රටේ තත්ත්වය අවුල්වන්නට විය. මෙසේ ඇති කළ නව වෙනස්කම් පිළිබඳ සිංහලයෝ අප්‍රසාදය දැක්වූහ. අලුත් බදු ක්‍රමයටත්, බදු එකතු කිරීමේ නව පිළිවෙතටත් එරෙහිව ඔවුහු මහත් විරෝධයක් පෑහ.

මෙම විරෝධය වර්ධනය වීමට හේතු වුයේ නවක බදු ක්‍රමයයි. එනම් පොල් ගස් බද්දයි. එයට අනුව එක පොල් ගසකින් රජයට රිදී පනමක් අවුරුදු පතා ගෙවිය යුතු විය. මෙම බද්ද ඇති කිරීමට හේතු වූයේ රජයෙන් ලත් ඉඩම් වගා කරන්නන්ගෙන් ගැණුනු සේවාවන් අහෝසි කිරීමෙන් ඔවුන්ගේ කිසිදු මුදලක් සමාගමේ ආදායමට එකතු නොවීමයි. බද්ද ගැණුනේ ගස් අනුව මිස ඵලදාව සළකාගෙන නොවේ. බොහෝ ගස් වසරකට ප්‍රමාණවත් ඵලදාවක් ලබාදීමට නොහැකි විය. ජනතාව බද්ද පොල් වලින් ගෙවීමට කැමති වුවද මුදලින් ගෙවීමට රේන්දකරුවන් බලකර ඇත. මෙම තත්ත්වය තුළ ජනතාව ප්‍රකෝපවන්නට විය.

මහජනයා හා ආණුඩුවේ සබඳතාව අතර ඇතිවූ මෙබඳු ක්ෂණික වෙනස්වීම් නිසා හටගත් හිරිහැර සහ අප්‍රසාදය හේතුකොටගෙන 1796 දී කැරැල්ලක් ඇති විය[9]. මෙමම කැරැල්ල සියනෑකෝරළය, හාපිටිගම සහ කොළඹ ආදී ප්‍රදේශවල පැතිරුණි. 1798 මාර්තු වන තෙක්ම බ්‍රිතාන්‍යයන්ට කැරැල්ල

මැඩපැවැත්වීමට නොහැකි විය[10]. වන්නාතර වල සැඟවී සිටි කැරලිකරුවෝ බ්‍රිතාන්‍යයන්ට පහර දුන්නෝය. ස්වකීය තානාන්තරවලින් පමණක් නොව තමන්ට බලය හා ධනය ලබාදුන් නින්දගම් ආදියෙන්ද පිරිහීයාමෙන් පමණක් නොව පොල් ගස් වලට ගෙවිය යුතු බදු ගෙවීමටද සිදුවූ මුදලිවරුන් විසින් මේ කැරැල්ල නිසැකයෙන්ම ඇතිකරන ලද්දක් යැයි සිතිය හැකිය.

ඉංග්‍රීසි නිළධාරීන් ඉහත පෙන්වාදුන් පරිදි බදු අයකර මුලෑදෑනින් බලයෙන් පහ කරයි. ඒ සඳහා විදේශීන් පත් කළත් සම්පූර්ණයෙන්ම දේශීය අය පහකරන්නේ නැත. අස්වැන්නේ ස්වභාවය අනුව බද්ද තීරණය කළේ මුලෑදෑනීන් නිසා බද්ද තීරණය කළාට පසුව රේන්දකරුවන් එය අයකර ගනී. මොවුන් බොහෝ විට මුස්ලිම්වරුන්ය. මෙම ක්‍රමය ඉංග්‍රීසි නිළධාරීන් පැමිණ මූලාදෑනී අදහස් නොවිමසා බදුඅය කිරීමේ ක්‍රමය අනුගමනය කරයි. අස්වැන්නේ ප්‍රමාණය අධික ලෙස තක්සේරු කරයි. ඇතැම් විට ස්වභාවික හේතු නිසා අස්වැන්න පාලු වුවත් කිසිදු සහනයක් නොලැබේ. සාමාන්‍ය ඉතිහාසකරණයේ හැඟීම වන්නේ පීඩනය වැඩිවනවිට කැරලි වැඩිවීම. මෙම තර්කය තවදුරටත් පිළිනොගෙන ජේම්ස් ස්කොට් විසින් නව න්‍යායක් ඉදිරිපත් කරණු ලැබීය. ඔහුගේ තර්කය වන්නේ පීඩනය වැඩිවූ විට කැරලි ඇති නොවේ[11]. ගැමියා පීඩනයට හුරුවී ගැමි සමාජය ඒකාග්‍රවන තරමට පීඩනය දරා සිටීමේ හැකියාව වැඩිවේ. එනිසා අනිවාර්යයෙන්ම කැරලි ඇති නොවේ. ගැමි සමාජවල යුක්තිසහගතව සාමාන්‍ය පිළිගැනීමක් ඇත. බදු ගෙවීමට නොහැකි වීම නිසා ජනතාව මරණයට පත් නොවේ. සම්ප්‍රදායික සමාජය ගුණධර්ම මත සකස්වූ බැවින්, අවම වශයෙන් මුලාදෑනියාගේ නිවසේන් යැපීමට ගැමියා හැකිවිය. ජේම්ස් ස්කොට් පවසන ආකාරයට ගැමි සමාජවල නිල නොවන සමාජ සම්බන්ධතාවලින් බිහිවන රක්ෂණ ක්‍රමයන් පැවති බව පෙන්වා දේ[12]. ඒ සඳහා මූලිකව ක්‍රියාකරන්නේ මුලාදෑනිවරයායි. 1797 ගැමියන් ඉන්දියානු නිලධාරීන්ට විරුද්ධව සටන් කරන විට මුලාදෑනි බලය ස්ථාපිත කිරීමට ක්‍රියාකරන්නේ ඇයි කියා ප්‍රශ්නයක් ඇති වේ. නමුත්, ලංකාවේ ගැමියන්, සිවිල් සේවකයින් බදු නියමකරනවාට වඩා මුලාදෑනින්ගේ මැදිහත්වීම අගයකොට තිබේ. විශේෂයෙන්ම කැරැල්ල අවසානයේ කරුණු සොයා බැලීමට පත්කළ (1798) ඩී. මියුරන් හමුදා නාකයෙක්ය[13]. එබැවින් ඔහු හට පාලනය පිළිබඳ හොඳ දැනීමක් පැවති අතර, සිංහල සිරිත් විරිත් හොඳින් අවබෝධ

කරගෙන තිබුණි. ඔහුගේ දැනීම භාවිතාකර නැගෙනහිර වෙළඳ සමාගම නැවතත් පැරණි ක්‍රමය ස්ථාපිත කරයි. ඒ අනුව ගැමියන් ප්‍රථම වතාවට ජයග්‍රහණය කරනු ලැබේ. ප්‍රභූවාදී ඉතිහාසකරණයේ දක්නට ඇත්තේ මේ කැරලිවල මූලිකත්වය ගන්නේ මුලාදෑනීන් බවයි. නමුත් ඔහුගේ නායකත්වයට වඩා කැරැල්ල මඟින් ඔවුන් ඉදිරියට තල්ලුවේ. කැරලිකරුවන් තුළින්ම නායකත්වය එනම් මුලාදෑනීන්ගේ කීමට කටයුතු නොකරණු ලැබේ. පීඩනය අධික වූ ප්‍රමාණයට කැරලි ඇති නොවේ. 1796-1798 කාලයේ මුදාදෑනීන්ට බදු ක්‍රමයේ පීඩනය මර්දනය කළ නොහැකිය. එය බොහෝ අවස්ථාවල මුලාදෑනීන් දක්වයි. කැරැල්ල අවසානයේ වාර්තාව දෙනවිට පවා ගැමියන්ට අහිතකර නොවන ලෙස ලබාදීමට ක්‍රියාකර ඇත. මුදාදෑනීන්ගේ ධනය පදනම් වූයේ ඉඩම් හා වස්තුව මත නොව පිරිස් සංඛ්‍යාව මතය. එබැවින්, ගැමියන්ට හානි නොවන ආකාරයෙන් කටයුතු කිරීමට මුලාදෑනීන් වගබලා ගත්හ. මේ ආකාරයට ගැමියන් ජයග්‍රහණ කිරීමත් සමග අලුතින් ලබාගත් ප්‍රදේශ සතු වැදගත්කම නිසා ඒවායෙහි පරිපාලනයෙහිලා මව් රජය සහභාගී වීමට තීරණය කළේය. 1798 සිට 1802 දක්වා බ්‍රිතාන්‍යයන් ද්විත්ව පාලන ක්‍රමයක් අනුගමනය කළද 1802 පසු බ්‍රිතාන්‍ය රජයේ යටත් විජිතයක් ලෙස ඍජු පාලනයක් ගෙනෙනු ලැබීය[14].

ඉන් අනතුරුව බ්‍රිතාන්‍ය යටත්විජිතවාදයට එරෙහිව 1818 කැරැල්ලක් ඇති විය. මෙම කැරැල්ල ඇතිවීම සඳහා ප්‍රභූන්ගේ දායකත්වය දක්නට ලැබුණද ගැමි ජනතාවගේ පීඩනය ද ඒ සඳහා බලපාන ලදි. ප්‍රභූවාදී ඉතිහාසකරණය මඟින් මෙය උඩරට රදළවරුන්ගේ කැරැල්ලක් ලෙස පෙන්වුවද එහි ග්‍රාමීය ජනතාවගේ අපේක්ෂාවන් ද ගොනු වී තිබුණි. උඩරට පළාත් හා මුහුදු බඩ පළාත් එකම ආධිපත්‍යයක් යටතට ගනු ලැබූ නමුත්, ඒ දෙක පැහැදිලිවම වෙන්වූ කොටස් දෙකක් නිසා සමාන ලක්ෂණයන්ගෙන් යුත් ඒකාබද්ධතාවයක් නොවීය. අයබදු සහ අධිකරණ යන සෑම අංශයකම පාලනය සම්බන්ධයෙන් ඒ දෙකෙහි ඉමහත් වෙනසක් පෙනෙන්නට විය. උඩරට පාලනය බ්‍රිතාන්‍ය නේවාසික නියෝජිත නීතිය පිළිබඳ කොමසාරිස්, ආදායම් පිළිබඳ කොමසාරිස්, යුධ හමුදා අණ දෙන නිලධාරි යන අයගෙන් සහ ලේකම් වරයෙකුගෙන් සමන්විත මණ්ඩලයකට පවරන ලදි.

මෙසේ නව පාලන රටාව උඩරට ඇතිවීමත් සමග ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් නෙරපා දැමීමට එකතු වූ රදළවරු, භික්ෂූන් වහන්සේ හා මහජනයා වැඩිකල් යාමට පෙර ගිය නුවණ ඇතුන් ලවාවත් ඇදගත නොහැකි බව වටහා ගත්හ[15]. උඩරට ගිවිසුමෙන් අපේක්ෂා කළ පරිදි බ්‍රිතාන්‍යයන්ගෙන් ඔවුනට වැඩි උසස් කම්, ගරු බුහුමන්, පුද සත්කාර නොලැබුනි. බ්‍රිතාන්‍යයන් කෙරෙහි ඔවුන් රැදවූ බලාපොරොත්තුව කඩවුණ අතර විදේශිකයන් තුළ පැවති විශ්වාසයද හීන විය. පාලකයා හා පාලිතය අතර පරතරය වැඩිවිය. සිතුම් පැතුම් ගති පැවතුම් සිරිත් විරිත් හා භාෂාව හා සභ්‍යත්වය අතින් උඩරට වැසියා හා බ්‍රිතාන්‍ය නිළධාරීන් අතර විෂමතා වැඩිදියුණු විය.

ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන කාලයේදී සිරිත් විරිත් හා සම්ප්‍රදායන්ට අනුව උඩරට පාලනය ගෙනගිය ද රදළවරුන්ගේ බලපෑම විශේෂයෙන්ම ප්‍රත්‍යන්ත ප්‍රදේශවල ඉතා අධික විය. රටවැසියා විසින් රදළවරුන්ට කළ සත්කාර ගරු බුහුමන් නැති වන්නට විය. ආරම්භයේ ආර්ථික වශයෙන් පිරිහෙන්නට විය. උඩරට රාජ සභාවට හිමිවූ තේජානුකූල උත්සව පුද සිරිත් රදළයන්ට නැතිවිය. රදළ ප්‍රධානීන් බ්‍රිතාන්‍යයට පක්ෂව ක්‍රියාකළේ තමනට වැඩි බලතල හා වරප්‍රසාද ලබැගැනීමට වුවත්, බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ එය ඉටු නොවීය. දෙවන රජ්ජුරුවන් වශයෙන් ඇහැලේපොළ කටයුතු කරුණු ලැබුව ද ඔහුට රජකම දීමට බ්‍රිතාන්‍ය පාලකයෝ නොසිතූහ. උඩරට රාජ්‍ය යටත්කර ගැනීමේ වන්දියක් ලෙස ඇහැලේපොළට පල්ලේගම් අධිකාරම් ධූරය ඉංග්‍රීසීන් පිරිනැමුවත් ඔහු එය ප්‍රතික්ෂේප කළේය. මේ ආකාරයට ඇහැලේපොළ ඇතුළු උඩරට ප්‍රභූ පිරිස බ්‍රිතාන්‍ය පාලය ගැන කනස්සල්ලට පත්විය.

බ්‍රිතාන්‍යයන් විසින් භික්ෂූන් වහන්සේට දැක්වූ ගරු සැළකිලි මහජනයා තෘප්තිමත් කිරීමට ප්‍රමාණවත් නොවීය. එකිනෙකා කුල ගෝත්‍ර සම්බන්ධයෙන් කිසිදු වෙනසක් නොමැතිව ක්‍රියාකළ අයුරුද සිංහලයන්ගේ සිත් නොගත්තේය.රජ වාසල ශ්‍රී විභූතියට පුරුදුවූ උඩරැටියෝ ඈත රටක රජ කෙනෙකු ගැන සිතා ගැනීමට අපොසත් විය. පහතරට වැසියන් අපේක්ෂා කළ සහය ඔවුනට නොලැබී ගිය අතර, උඩරටවාසීහු තමන්පිට පැටවුණු සහනය ගැන තැකීමක් නොකළහ. එහි ප්‍රතිඵලය වූයේ සියල්ලන්ම අතෘප්තියට පත්වීමයි.

බෞද්ධ භික්ෂූන් වහන්සේලාද කලකිරීමට පත්වූහ. සිංහල රජු අනුගමය කිරීමට කොතරම් වෑයම් කළ ද බෞද්ධාගමික පූජෝත්සවාදියට සහභාගී වීමට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාට නොහැකි විය. 1815 ගිවිසුම අත්සන් කර වසරක් ගතවීමට පෙර කුමන්ත්‍රණ ගණනාවක් පිළිබඳ තොරතුරු ලැබුණත් බ්‍රිතාන්‍යයන් ඉක්මන් නොවීය[16]. එහෙත් 1816 වර්ෂය අවසාන වන විට රජයේ අවධානය යොමු නොකර සිටිය නොහැකි කුමන්ත්‍රණ ගණනාවක් පිළිබඳ තොරතුරු හෙළිවිය. එක්නැලිගොඩ නිළමේ විසින් මේ පිළිබඳව රජයට කරුණු පෙන්වා දුන්නේය.[17] මෙම කැරැල්ල සංවිධානය කිරීමට භික්ෂූන් වහන්සේලාද මූලික විය. එහි පරමාර්ථය වූයේ බුරුමයෙන් රාජකුමාරයෙක් ගෙන්වා ලංකාවේ සිංහාසනාරූඪ කරවීමය.[18] සිංහල රජ කෙනෙකු පත්කිරීම සම්බන්ධයෙන් මතභේද උද්ගතවූ නිසා බුරුමය වැනි ථෙරවාදී රටකින් කුමරෙකු ගෙන්වීමට ක්‍රියාකිරීම කාලෝචිතය. සිංහල රජෙකු නැතිවී යාමෙන් ස්වකීය ආගම අන්තරාදායක තත්වයකට මුහුණ දුන් භික්ෂූන් තුළ වූ බිය මේ කුමන්ත්‍රණයට හේතු විය. කුමන්ත්‍රණය පිළිබඳ කරුණු හෙළවූ පසු උඩගබඩාවේ නිළමේ හා මඩුගල්ලේ හැර අන් කිසි රදළ ප්‍රධානියෙකුට නඩු ඇසීමට තරම් සාක්ෂි නොවීය[19]. ඉහගම හා පොල්වත්තේ භික්ෂූන් වහන්සේලාට චෝදනා ඉදිරිපත් කර එක පන්සලක නැවතී සිටිය හැකි කාලය සීමා කරන ආරක්ෂිත සිර දඬුවමක් දෙන ලදි[20]. බ්‍රිතාන්‍ය ආධිපත්‍ය විනාශ කර දැමීම සඳහා රදළවරු හා භික්ෂූන් වහන්සේලා විසින් විශාල කුමන්ත්‍රණයක් කරගෙන යන බව ආණ්ඩුවේ ප්‍රධාන භාෂා පරිවර්තක වූ විලියම් ටොල්ෆි විසින් උඩරට කටයුතු භාර ලේකම්වරයාවූ සදර්ලන්ඩ්වෙත නැවත නැවතත් දැන්විය. මේ තොරතුරු එතරම් සැලකිල්ලට නොගත්තද ප්‍රවේශම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි.[21] මෙම කුමන්ත්‍රණයෙන් හෙළිවූ කරුණු වන්නේ උඩරට රදළයන් තුළ මෙන්ම භික්ෂූන් වහන්සේලා තුළ ද බ්‍රිතාන්‍ය ආධිපත්‍ය ගැන ප්‍රසාදයක් නොවූ බවයි. මෙම අවධිය වනවිට රට අභ්‍යන්තරයේ කඩවත් භාරව සිටි නිලධාරීන්ට තීරු බදු ගෙවීම එක් අයෙකුගේ යටතේ වූ පසුව කඩවත් පවත්වාගෙන යාම අසීරු විය. එම නිසා ආණ්ඩුව කීප දෙනෙකුගේ බදු අහෝසි කර ඇත. මෙම නීතිය නිසා සතර කෝරළය ඌව, සබරගමුව, සහ කලාවිය යන දිසාවන් භාරවූ අධිපතීන්ට කඩවත් වලින් ලද තීරු බදු අහිමි විය. ඒ සමඟම ඔවුන්ගේ ආදායම් මාර්ගයන් වැසී ගියේය. මෙරට වැසියන් සතු

සියළුම කඩු, උල් හා වෙනත් යුධ උපකරණ මහනුවර කච්චේරියට හෝ ඒවා ලබාගැනීම සඳහා ආණ්ඩුවේ බලය පවරා දෙන ලද නිලධාරීන්ට හෝ ගෙනගොස් දියයුතු බව ප්‍රකාශයට පත්විය. මෙම නියෝගයෙන් යුද්ධායුධ බෙදාහරින්නන් ලෙස අධිපතීන් දැරූ බලතල අහිමිවී සියලු බලපත්, අවසරපත් ආදිය මහනුවර කාර්යාලයෙන් ලබාගැනීමට සිදුවූ නිසා ජනතාවද ප්‍රභූ නිලධාරීන් ද දැඩි අපහසුතාවයට පත්විය.

උඩරට රාජ්‍ය සමයේ සිට පැළපැදියම් වී සිටි මුස්ලිම් ජනතාව බ්‍රිතාන්‍ය පාලනයට සහය දක්වමින් චර පුරුෂ සේවයෙහි යෙදෙමින් බ්‍රිතාන්‍යයන්ගෙන් වැඩි වාසි අපේක්ෂා කළහ. මෙවැනි තත්ත්වයක් තුළ 1818 කැරැල්ලට ආසන්න සිද්ධියක් ලෙස වෙල්ලස්සේ මුස්ලිම් ජනතාව මඩිගේ මුහන්දිරම්කමට සිංහලයෙකු වෙනුවට මුස්ලිම් ජාතිකයෙකු පත්කළ යුතුයැයි බ්‍රිතාන්‍ය පාලකයන්ගෙන් ඉල්ලා සිටියහ. බ්‍රවුන්රිග් ආණ්ඩුකාරතුමා යටත්විජිත ජනතාව භේදකර පාලනය කිරීමේ බ්‍රිතාන්‍ය යටත්විජිත ප්‍රතිපත්තිය අකුරටම අනුගමනය කරමින් ''හජ්ජි මරික්කාල්'' නැමති යෝනකයකු මුහන්දිරම් පදවියට පත් කළේය. මෙම ක්‍රියාවෙන් සිංහල ප්‍රධානීහු බ්‍රිතාන්‍යයන්ට එරෙහි වන්නට වූහ.

වෙල්ලස්සේ තත්වය උග්‍රවීමත් සමග බෞද්ධ භික්ෂූන්ගේ සහය ඇතිව කොබ්බෑකඩුවේ, මිල්ලෑව සහ කැප්පටිපොළ යන අය කැරලිකරුවන්ට එක්වූහ. 1817 අවසාන වනවිට උඩරට පළාත්වල කැරලිකාර තත්ත්වයක් උද්ගත විය. විදේශීය ආණ්ඩුවක් කෙරෙහි ඔවුන් තුළ තිබූ ස්වභාවික අවිශ්වාසය නිසා පොදු ජනතාව සිටියේ බ්‍රිතාන්‍ය රජය කෙරෙහි අප්‍රසාද ජනක තත්ත්වයකිනි.[22] කැරැල්ල ආරම්භයේ පටන්ම ඊට ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ සහභාගීත්වය දක්නට ලැබිණ.[23] යුද්ධ නීතිය ප්‍රකාශ කරමින් ගම්මුන්ගේ ධන ධාන්‍ය හා ගවමහිෂාදීහු පැහැරගන්නා ලදහ. වාරි මාර්ග විනාශ කර ගොවි කර්මාන්තයේ ජීවය විනාශ කරමින් ගම් බිම් පාලුවට හරින ලදි. කැරැල්ල සාර්ථක ලෙස මැඩපැවැත්වීමට හැකිවූ නිසා උඩරට පළාත් පාලනය සම්බන්ධයෙන් සවිස්තරාත්මකව ප්‍රතිසංස්කරණ ඇති කිරීමට බ්‍රිතාන්‍යයන්ට අවස්ථාව උදා විය.[24] විශාල පිරිසක් සිරභාරයට ගනිමින් දඬුවම් ලබාදුන් අතර, කැරැල්ල පැවති සමයේ කැති, පොරෝ, උදළු සමග ඉඩම්වල ගොවිතැන් කටයුතුවල යෙදුණු

අහිංසක ජනතාව පවා සිරභාරයට ගෙන දඬුවම් ලබාදුන්හ. මෙම කැරැල්ල ඇති වීමෙන් පසු සිංහලයන්හට නොයෙක් අපහසුතාවයන් ඇතිවන ආකාරයෙන් නව පාලන ක්‍රමයක් ස්ථාපිතකරණු ලැබීය. එය 1818 නොවැම්බර් 21 වන දින ප්‍රකාශනයෙන් නව පාලනය පිහිටුවීමට අවශ්‍ය මංපෙත් විවරකර ගන්නා ලදි.[25] මෙරට භික්ෂු සමාජයටත්, ප්‍රභූන්ට සහ සාමාන්‍ය ජනතාවටත් හානිදායක වන අන්දමේ වගන්ති ඇතුළත් කරමින් නව පාලනය ස්ථාපිත වූ බව පෙනේ.

මේ ආකාරයෙන් බලනවිට 1818 කැරැල්ල ප්‍රභූන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා රදළ ප්‍රධානීන් ඇතිකළ එකක් පමණක් නොව සාමාන්‍ය ජනතාවගේ සෘජු දායකත්වයද දක්නට ලැබුණි. එනිසා මෙයද කැරැල්ලක් ලෙස හඳුනාගත හැකිය. මෙම අවධියේ ගැමියන්ට තිබුණු ප්‍රශ්න මොනවාද? තමන්ට තිබුණු වරප්‍රසාද, බුද්ධාගමට තිබූ තැන ආදිය පිරිහීයයි. 1818 කැරැල්ල අවසන් වී වසරක් යාමට පෙර නව බදු ක්‍රම ඇති කරයි . බදු අය කිරීම අකුරටම සිදුකර ඇත. නියම ගැටළුව ඇති වන්නේ එවිටය. සාම්ප්‍රදායික සමාජයක තිබුණු බදු ක්‍රමය යටත් විජිතවාදය තුළින් නීති පද්ධතියක් මඟින් කාර්යක්ෂම කරයි. නීතිය ඉදිරියේ කිසිවෙකුට අනුකම්පා කිරීමක් නොමැත. එනිසා ගැමියා හා නීතිය අතර සම්බන්ධතාවයක් නොවීය. ග්‍රාමීය සමාජයේ පැවති නිලධාරි සම්බන්ධතා වෙනුවට නීති පද්ධතියක් පැමිණීම නිසා පාලකයන් හා පාලිතයන් අතර, අන්‍යෝන්‍ය සම්බන්ධතාවය බිඳවැටී පීඩනය වර්ධනය විය. 1817-1818 උඩරට ඇතිවූ කැරැල්ල උඩරට නායකත්වයේ උවමනාවට ඇතිවූවක් නොව සාමාන්‍ය ජනතාවගේ දුක්ගැනවිලි රාශිකයක් තිබුණි. එබැවින් එම කැරැල්ල ගැමි අරගලයක් ලෙස පෙන්වාදිය හැක.

මෙසේ 1818 කැරැල්ල අවසාන වුවද 1848 දී බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව නැවතත් කැරැල්ලක් ඇති විය. මෙම කැරැල්ල සෙසු කැරලිවලට වඩා වෙනස් බව පෙනේ. මෙහි පැහැදිලිව යටත්විජිතවාදයට විරුද්ධව ගැමි කැරැල්ලක ලක්ෂණ රාශියක් ඇත. එබැවින්, යටත්විජිතවාදී පීඩනයට එරෙහිව ගැමි ජනතාවගේ ප්‍රබල ක්‍රියාකාරීත්වයක් මේ තුළ ඒකරාශී වී තිබේ.

1848 වර්ෂය ලෝකයේ විප්ලවීය වර්ෂයක් වශයෙන් පෙන්වා දිය හැකිය.

එම නිසා මෙම අවධියේ ඇතිවූ විප්ලව මඟින් ලෝකයේ ගමන් මග තීරණාත්මකව නව මාවතකට ප්‍රවිෂ්ට කිරීම සඳහා අවශ්‍ය පසුබිම විවර විය. ලංකාව සම්බන්ධයෙන්ද, ඒ ආකාරයෙන්ම බලපාන්නට විය. 1818 පසුවද බ්‍රිතාන්‍ය රජය මුලින් ඇතිවූ කැරලිවලින් පාඩමක් උගත් බව නොපෙනේ. ඉන් අනතුරුව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී දේශපාලන, ආගමික, සංකල්ප හා න්‍යායන් මෙරටෙහි ක්‍රියාත්මක කරන්නට විය. මෙපමණ කාලයක් තමන් විසින් උරුම කොටගත් සංස්කෘතියෙහි පැවැත්මට බාධා එල්ල වීමත් සමග එයට එරෙහි වන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස 19 වන සියවසයේ දෙවන භාගය වනතෙක්ම නොයෙක් කැරලි උද්ගත විය. එම කැරලිවල විශේෂත්වය වන්නේ භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය කැපී පෙනීමයි. 1822 වන විට මාතලේදී කැරැල්ලක් ඇති විය. එහි නායකත්වය කහවත්තේ හිමියන් විසින් ගනු ලැබීය.[26] 1834 දී තව කැරැල්ලක් ඇති වුවත් එහි සාර්ථකභාවයක් ඇති නොවීය. 1842-1843 කාලයේදී උඩුදුම්බර ප්‍රදේශයේ රාජ ප්‍රතිරූපකයකු සැරිසරන බවත්, අවිරැස්කිරීම සහ මහජනතාව බ්‍රිතාන්‍ය රජයට විරුද්ධව උසිගැන්වීම් සිදුවන බවත්, එවකට ආණ්ඩුකාරතුමා වූ කෝලින් කැම්බල්ට ආරංචි විය. වහා ක්‍රියාත්මක වූ රජය රාජ ද්‍රෝහී චෝදනා පිට කීපදෙනකු අත් අඩංගුවට ගත්තහ. ඒ අතර, දීනිස්, ඩේවිඩ්, ඩිංගිරාළ සහ චන්ද්‍ර ගුප්ත යන නායකයින් හතරදෙනෙක් නඩු විභාගය සඳහා මහනුවරට ගෙන චෝදනා ඔප්පු කිරීමට බැරිවූ නිසා නිදහස් කරනු ලැබීය.[27] මේ අතරතුර කොත්මලේ සහ ඌව ප්‍රදේශවල රජයට විරුද්ධව උසිගැන්වීම් ක්‍රියාත්මක විය. 1843 වනවිට ගොන්ගාලේගොඩ බණ්ඩාගේ සොහොයුරකු වූ දීනිස් චෝදනා පිට අත් අඩංගුවට ගත්තද එය අසාර්ථක විය. මේ ආකාරයට 1843 දක්වා නොයෙක් ආකාරයෙන් අධිරාජ්‍ය පාලනයට එරෙහිව ජනතාව පෙළ ගැසුනද එහි එතරම් සාර්ථකභාවයක් දක්නට නොවීය.

මෙවැනි කැරලිකාර මාවතක් තුළ සිට 1848 කැරැල්ල ඇතිවීමට කරුණු සැළසුණි. මෙම කැරැල්ල ඇතිවීම සඳහා සෘජු වශයෙන් 1848 දී ටොරින්ටන් සාමිවරයා විසින් පනවන ලද බදු හේතු වුවත් දීර්ඝකාලීනව මෙරට සමාජයේ ගොඩනැඟුණු වෙනත් හේතු සාධකද බලපාන්නට විය.[28] ඒ අතුරින් 1815 ගිවිසුම් ව..න්ති කඩවීම හා 1832 මෙරට ඇති කල කෝල්බෲක්, කැමරන්

ප්‍රතිසංස්කරණවල ඇතැම් අහිතකර තත්ත්වයන්ද ඒ තුළ විය.

1832 ඇතිකරන ලද නව ප්‍රතිසංස්කරණ හේතුකොටගෙන සමාජීය, ආර්ථික හා දේශපාලනික වශයෙන් දැඩි විපරිවර්තනයක් ඇති විය. යුරෝපයේ මෙම අවධියේ ඇතිවූ නව චින්තනයන්ගේ පහස ලබමින් නව සංකල්ප මත මෙරට ගොඩනැගෙන්නට විය. එම නිසා මෙතෙක් පැවති සාම්ප්‍රදායික ආර්ථික රටාව බිඳවැටී ධනවාදී ආර්ථික ක්‍රමයක් ගොඩනැගීමට පසුබිම සැකසීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කළේය.[29] වැඩවසම් ආර්ථිකයක ක්‍රමයකට හුරුවී සිටි ජනතාව වතු වගාව උඩරට ප්‍රදේශවල පැතිරියාම නිසා බිහිවූ වෙනස් ආර්ථික රටාව හමුවේ අතරමං විය. චිරාත්කාලයක් සිට මෙරට ජනතාව රාජකාරි සේවාව මත රදළවරයකුට හෝ විහාර දේවාලයකට රාජකාරිය ඉටු කිරීම නිසා ඉඩම් ලබාගැනීමට හැකි විය. එහෙත් රාජකාරි සේවාව අතහැර වතුවගා ක්‍රමයකට ජනතාව යොමු කිරීමත් සමඟ මෙතෙක් කල් ඔවුනට උරුමව පැවති ඉඩම්වල අයිතිය ක්‍රමයෙන් ගිලිහෙන්නට විය.

ඒ සඳහා බ්‍රිතාන්‍යයන් විසින් නව නීති සම්පාදනය කිරීමත් සමඟ ජනතාවගේ ඉඩම්වල අයිතිය පිළිබඳව නොයෙක් අර්බුද මතුවන්නට විය. උඩරට ප්‍රදේශවල වතු වගාව සඳහා පහසුකම් සැලසීමට ක්‍රියාකළ බ්‍රිතාන්‍ය රජය උඩරැටියා විසින් පෙර භුක්තිවිඳි ඉඩම් පෞද්ගලිකව අයිතිය පැවරෙන ආකාරයේ පනත් පනවන ලදී. 1840 අංක 5 දරණ ඉඩම් පනත හා 1840 අංක 12 දරණ මුඩු ඉඩම් පනත මේ බවට කදිම සාක්ෂි වේ.[30] මුඩුබිම් පනත මඟින් අයිතියක් නොමැති සියළුම ඉඩම් වැවිලි කටයුතු සඳහා ලබාගැනීමට හැකි විය. මෙසේ රාජසන්තක කළ ඉඩම් අක්කරය සිලිං පහ බැගින් යුරෝපීය වැවිලිකරුවන්ට විකුණන ලදී. වතු වගාවට ගැමියන්ගේ ඉඩම් කොටුවීමත් සමග මෙතෙක් ගැමියන් භුක්තිවිඳින ලද නිදහස අහිමිවිය. හේන් ගොවිතැන විනාශවීම, ගවයන් ඇති කිරීමට පැවති ඉඩ ඇහිරීම, පහත් ප්‍රදේශ වතු වගාව නිසා නිසරුවීම ආදී ප්‍රශ්න රාශියකට ගැමි ජනතාව හට මුහුණ දීමට සිදුවිය.

වතු වගාව ආරම්භ කිරීමත් සමඟ මෙතෙක් බ්‍රිතාන්‍යයන් කෘෂි කර්මාන්තය කෙරෙහි දක්වූ අවධානය අඩුවී කෘෂි කටයුතු අතපසුවන්නට විය.

වාරි මාර්ග කටයුතු ප්‍රතිසංස්කරණය නොකිරීමත්, ඇල වේලි නඩත්තුව අතපසු කිරීමත් නිසා ගැමියා තව තවත්, පීඩනයට පත්විය.[31] එබැවින් ගැමියාගේ පීඩනය වැඩි වී බ්‍රිතාන්‍ය රජය කෙරෙහි කලකිරීම තවදුරටත් වර්ධනය විය. පරම්පරා ගණනක්ම ඉඩකඩම් නිසාම සිය ජීවිතය ගෙනයමින් ඒවා කෙරෙහි අතිශයින් බැඳී සිටි ගම්වැසියා තමා අවට තිබූ ප්‍රදේශ පිටරැටියන්ට අයත්වීම ගැන දැඩි කලකිරීමකට පත්විය.

වැවිලි කටයුතු ව්‍යාප්තවීමත් සමග ගම්වල එක්තරා ප්‍රමාණයක නොසන්සුන්තාවයක් ඇති විය. නොයෙක් අංශයන්හි රැකී රක්ෂා ආරම්භ වීමත් සමග රජය තැබෑරුම් විවෘත කිරීමට අවසර දීම නිසා මෙකල රට පුරාම මත්පැන් පානය ව්‍යාප්ත විය. උඩරට ප්‍රදේශවල මෙතෙක් සුරාසැල් ව්‍යාප්ත නොවුවත් ඉතාමත් සීඝ්‍රයෙන් සුරාවට උඩරට ජනතාව ලොල් විය.[32] රජය ආදායම් ලබාගැනීමේ අරමුණින් මෙම කටයුතුවලට අනුග්‍රහය ලබාදුන්නද ගම්බද ප්‍රදේශවල ඇතිවූ දුශ්චරිත පිළිබඳ නිහඩව වගබලාගැනීමට පාලකයන් උත්සාහ ගත්තේය.

කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ සමග ඉංග්‍රීසි භාෂාව සහ නීතිය නොදත් ජනයා උසාවි බීමේ අතරමං විය.[33] මුදල් ඉපයීමේ අරමුණින් සහ රජයට වාසි ලබාගැනීම සඳහා ජනතාව නීතිය ඉදිරියේ තබමින් ඔවුන් උපයා ගත් මුදල විනාශ කිරීමට හැකිවිය. වැඩිදෙනෙකු නඩු මඟට බසිනු ලැබුවේ අකටයුක්තක් සම්බන්ධයෙන් සහනයක් ලබාගැනීම උදෙසා නොව පුද්ගලික එදිරිවාදිකම් පිරිමසා ගැනීම සඳහාය. පුරාණ කාලයේදී මෙබඳු වාද භේද දුරදිග යෑමට ඉඩනොදී ඒ ස්ථානයේදීම ගම් සභාව මඟින් සමථයකට පමුණුවන ලදී. එහෙත් මෙවකට නඩු හබ නිසා ගම්වැසියන් අතර දරුණු වෛරයක් ඇතිවීමෙන් ග්‍රාමීය ජීවිතයේ ශාන්ත භාවය ද ක්‍රමයෙන් පිරිහීමට පත්විය.

රජය කෙරෙහි ජනතා විරෝධය වඩාත් උග්‍ර වුයේ, බෞද්ධාගම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් අනුගමනය කළ ප්‍රතිපත්තිය නිසාය. 1815 උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් බෞද්ධාගම හා ඊට අයත් විහාර දේවාල නොකඩවා ආරක්ෂා කරන බවට පොරොන්දු වුවද මිෂනාරීන්ගේ දැඩි විරෝධය හමුවේ බිඳ වැටෙන්නට විය.[34] ස්පෙන්ෂර් හාඩි, ගොගලි වැනි අය මිත්‍යා දෘෂ්ටික

ආගමක් ක්‍රිස්තියානි රජයක් විසින් ආරක්ෂා කරන ආකාරය තදින් විවේචනය කර ඇත. එබැවින් 1847 අස්ගිරි හා මල්වතු යන උභය විහාරීය භික්ෂූන්ට සහ දියවඩන නිලමේතුමා ඇතුළු කොමිටියට එහි භාරකාරත්වය පැවරීමත් සමග මෙතෙක් රජය හා ආගම අතර පැවති සබඳතා බිඳ වැටුණි. භික්ෂූන් පවා නායක තනතුරුවලට පත්කිරීම අත්හැරීමත් සමග රටේ ජනතාව තුළ ඒ සම්බන්ධයෙන් තදබල විරෝධයක් ඇති විය. චිරාගත සම්ප්‍රදායට අනුව දළදාවේ හිමිකම දරණ පුද්ගලයාට රාජ්‍ය බලය හිමිවන බැවින්, සිංහලයෝ නැවතත් රාජ්‍ය බලය ලබාගැනීමේ අරමුණින් කටයුතු සංවිධානය කරන ලදහ.

මෙසේ රට අභ්‍යන්තරයේ පැවති තත්ත්වය අතෘප්තිකර වීමත් සමග ලෝක ආර්ථිකයේ ඇතිවූ ආර්ථික, අවපාතයෙන් මිදීම සඳහා එවකට ආණ්ඩුකාරවරයා වූ ටොරින්ටන් සාමිවරයා විසින් මෙරට ජනතාව වෙත සෘජු බදු හතක් පැනවිය. මුද්දර ගාස්තුව වැඩි කිරීම, කඩ සාප්පු, බෝට්ටු, රථ වාහන සහ බර කරත්ත අයත් වුවන්ට ඒවා තබාගැනීම පිණිස අවසර පත්‍ර ලබාගැනීම සඳහා වසරකට රන් පවුම බැගින් ගෙවීමට සිදුවිය.[35] තුවක්කුවට සිලිං 2 1/2 ක් ද බල්ලෙකුට සිලිමක් ද ගෙවන ලදි. සෑම පිරිමියෙකුටම පාරවල් ප්‍රකෘතිමත් කිරීම හා තැනීම සඳහා අවුරුද්දකට හය දවසක් වැඩ කිරීමට හෝ ඒ වෙනුවෙන් සිලිං තුනක බද්දක් ගෙවීමට හෝ ආණ්ඩුව විසින් නියෝග කරණ ලදි. 1847 ජූලි මස 6 දින බදු ක්‍රමය ගැන විරුද්ධත්වයක් ප්‍රකාශ කරමින් අත්සන් 4000 පමණ පෙත්සමක් ද ඉදිරිපත් කර ඇත.

මේ ආකාරයට 1846 න් පසුව ඇතිවන නොයෙකුත් පීඩනය නිසා ගැමියන්ගේ ජීවිතය දුෂ්කර විය. රජය ඉදිරියේ පෙත්සම් ගසමින් උද්ඝෝෂණය කළත් එය ගණන් ගත්තේ නැත.[36] එවිට කැරලි ඇතිවීමට ආගමික සංවිධාන බිහිවී ගොන්ගාලේගොඩ බණ්ඩා නායකත්වයට පත්වේ. මිනිසුන් ඒකරාශී කිරීමට මොහු සංකේත ලෙස භාවිතා කළත් නායකත්වය ගන්නේ භික්ෂූන්ය. කොළඹ හා මහනුවරින් ආරම්භ වූ කැරැල්ල මාතලේ, දඹුල්ල, වාරියපොළ හා කුරුණෑගල යන ප්‍රදේශවල සීඝ්‍ර ලෙස පැතිරේ. පන්දහසක් පමණ පිරිස මාතලේ රජයේ ගොඩනැගිලි විනාශ කර එහි මුද්‍ර බිම් පනතට සම්බන්ධ ලේඛන විනාශ කළහ. වතු විනාශ කිරීම ද දක්නට ලැබුණි. වාරියපොළ කෝපිවතු සහ ගබඩාවන්

විනාශ කරයි. කුරුණෑගල කච්චේරියේ සහ උසාවියේ හේන් සහ අනෙක් ඉඩම් වාර්තා කොල්ල කන ලදි. ඇයි ජනතාව මෙසේ කරන්නේ ? එම දේ තමා ඔවුන්ගේ අසහනයට හේතු වූ කාරණාවන් වන්නේ, සාමාන්‍ය ගැමියන් තමන්ගේ සතුරන් හඳුනාගෙන පහරදීම සිදුකරනු ලැබේ. ග්‍රාමීය පීඩනය දරා ගැනීමට බැරිවිට ඔවුන් දේශපාලන වශයෙන් අපේක්ෂා කරන දේ අවබෝධ කර ගැනීම, කැරලි වලට භාජනයවන ඉලක්ක මඟින් අරමුණු පැහැදිලි වේ. මෙහි දේශපාලන අරමුණු වූයේ යටත්විජිතවාදයෙන් නිදහස් වීමයි. කේ.එම්. ද සිල්වා මහතා මෙය උඩරට ජාතිවාදය ලෙස පෙන්වා දේ.[37] මොවුන් මෙම අවස්ථාවේ ජාතියක් ගැන සිතනවාට වඩා යටත්විජිත ආධිපත්‍යයෙන් මිදීමට පැරණි ක්‍රමය තුළ ක්‍රියාකරයි.

යටත්විජිත සමාජවල පීඩනය යම්කිසි පදනමක් මත ස්ථාපිත වී වාර්ගික ක්‍රියාකාරීත්වයද බලපානු ලැබේ. එම අවස්ථාවේදී පැහැදිලිවම රාජ්‍ය ගැන සංකල්පයක් දක්නට නොලැබේ. ස්වරාජ්‍ය ගැන හැඟීමක් මේ තුළ අන්තර්ගතව නැත. නමුත් කැරලි ගසනවිටදී නොයෙක් කොඩි රැගෙන ගොස් ඉංග්‍රීසි රජය අවසන් බව පෙන්වයි. 1848 කැරැල්ල සඳහා ප්‍රභූ නායකත්වය ඉදිරියට නොයන අතර, ඔවුන් පසකට වී බලා සිටී. එනිසා මෙම කැරැල්ල ගැමි ජනතාවගේ කැරැල්ලක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන්ම මෙම අවස්ථාවේදී කැරලිකරුවන් නොයෙක් ක්‍රම මඟින් ප්‍රභූන් අකර්මණ්‍ය කර ඇත. රජයේ නිලධාරීන් ලෙස කැරැල්ලට සහය දැක්වීම නීති විරෝධී වේ. එබැවින් කැරලිකරුවන්ගේ ආකල්ප පිළිගන්නා අය නායකයන් ලෙස හඳුනාගැනීමට කැරලිකරුවෝ ක්‍රියා කරනු ලැබූහ. ඒ අනුව ගොන්ගාලේගොඩ බණ්ඩා, වීර පුරන්අප්පු, ඩිංගිරාළ වැනි අයගේ නායකත්වය කැපී පෙනෙන්නට විය.

මෙසේ කැරැල්ල ඇති වුවත්, සිංහලයන්ගේ නායකත්වයට පවතින තරඟය නායකත්වයේ අකාර්යක්ෂමභාවය, සංවිධානයේ පවතින දුර්වලතාවයන් වැනි හේතු නිසා කැරැල්ල අසාර්ථක වේ. කැරලිකරුවන්ට කෲර දඬුවම් පමුණුවන ලද නමුත්, ගැමි ජනතාව එමඟින් සාර්ථක ප්‍රතිඵලද ලබාගත්හ. මෙම කැරැල්ල පිළිබඳව සොයාබැලීමට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විශේෂ කමිටුවක් පත්කර ඇත. මෙම කමිටුවට හෙන්රි බේලි, ශ්‍රීමත් රොබට්පීල්, ඊ. ගැල්ස්ටන්, බෙන්ජමින් ඩිස්රයෙලි, ජෝශප් හියුම් සහ ශ්‍රීමත් විලියම් මෝල්ස්වර්ත් අය මෙහි සාමාජිකයන්

වූහ. ඔවුන් පෙන්වා දුන් කරුණු අනුව යටත්විජිත ලේකම් ග්‍රේ සාම්, ටොරින්ටන් ආණ්ඩුකරු, යටත්විජිත ලේකම් වන එමර්සන් ටෙනන්ට් වහාම මව් රාජ්‍ය වෙත කැඳවා ඇත. මෙතෙක් ජනතාව විරෝධය දැක්වූ සියලු බදු වර්ග අහෝසි කරන ලදී. එයින් ගම්‍ය වන්නේ 1797 කැරැල්ලේදී මෙන් ග්‍රාමීය ජනතාවගේ අපේක්ෂාවන් ජයග්‍රහණය කිරීමට හැකිවූ බවයි.

මේ අනුව පැහැදිලි වන්නේ බටහිර ධනේශ්වර පන්තියේ ආකල්පයන් උද්දීපනය කරමින් රචනා කරණු ලැබූ ඉතිහාසකරණ සම්ප්‍රදායේ දක්නට ඇත්තේ අපක්ෂපාතී මතවාදයන් නොව පක්ෂග්‍රාහී ඉතිහාසකරණ සම්ප්‍රදායක් බවයි. යටත්විජිතවාදය සාධාරණීය කරමින් මෑතක් වනතුරුම ඉතිහාසය රචනා වුවත් පශ්චාත් නූතනවාදයේ ආරම්භයත් සමග දැඩි ප්‍රශ්න කිරීමකට භාජනය විය. රනජිත් ගුහා වැනි අයගේ මතවාදයන් ඉදිරිපත් කිරීමත් සමග යටත්විජිතවල ක්‍රියාත්මක වූ අරගලයන්ගේ වැදගත්කම වර්ධනය වන්නට විය. විශේෂයෙන්ම ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමේදී යටත්විජිතවාදයට එරෙහිව සන්නද්ධ අරගල ක්‍රියාත්මක නොවූවත් ගැමි කැරලි ඇති විය. 1798, 1818 සහ 1848 කැරලි පිළිබඳ සාම්ප්‍රදායික ප්‍රභූ ඉතිහාසකරණය මඟින් එතරම් විශේෂ අවධානය යොමුකර නොමැති බව ගම්‍ය වන කරුණකි. නිදහස කරා ගිය ගමනේදී ලංකාවේ ප්‍රෞඩ ඉතිහාසය ගෙනහැර පෑමට ඉහත කැරලි සඳහා ප්‍රමුඛස්ථානය ලබාදුන්නද

ග්‍රාමීය ජනතාවගේ හඬ ඉස්මතු කර දැක්වීමට අපොහොසත් වී ඇත.

**පාදක සටහන්**

1. Articles of Capitulation, 15 Feb, 1796, Legislative of the Ceylon Government (1797-1837) P, 14
2. විමලරත්න කේ.ඩී.ජී. ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය, රත්න පොත් ප්‍රකාශකයෝ කොළඹ - 1992 පිටු
3. Kannangara P.D. The History Of Ceylon Sivil Service, Dehiwala, 1960, P. 02
4. පෙරේරා එස්.ජී. ලංකා ඉතිහාසය එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සංගමය, කොළඹ, 1945, පිටු 28.
5. එම පිටු 28.
6. එම පිටු 30.
7. මෙන්ඩිස් ජී.සී. ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය, ඇපොතිරිකස් සමාගම, කොළඹ 1963 පිටු 38.
8. එම පිටු 39.
9. එම පිටු 39.
10. The History Of Ceylon Sivil Service P. 06.
11. Scotte, James, The Moral Economy of the Peasant Rebellion and Subsistence in South east Asia, Yale University Press, Lon don, 1976, P. 45.
12. Ibid, P. 47.
13. ලංකා ඉතිහාසය පිටු 32.
14. ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය පිටු 64.

15. ලංකා බ්‍රිතාන්‍ය .ආධිපත්‍ය පිටු 34.

16. Ceylon Under The British Ocaupation, vol, 1, P 163.

17. Ceylon Government Archives, 5/8, Brownrigg to secretary of Sate, Nov. 1816.

18. ඉලංගසිංහ, මංගල, රාජ්‍ය හා ආගම , කැළණි විශ්ව විද්‍යාලය-මොරටුව පිටු 95.

19. විමලානන්ද, තෙන්නකෝන්, උඩරට මහා කැරැල්ල, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ පිටු 20-62.

20. එම පිටු 20-62

21. C.G.A. 5/8, Brownrigg to Secretary of State 6, Feb 1817

22. C.U.B. OP. 161

23. C.G.A. 5/8, Brownrigg to Secretary of State 6, Feb 1817

24. උඩරට මහා කැරැල්ල පිටු 107

25. රාහුල වල්පොල භික්ෂුවගේ උරුමය, ගුණසේන සහ සමාගම, කොළඹ 1963 පිටු 45

26. ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය, පිටු 42.

27. එම පිටු 43.

28. ඊරියගම, තිස්ස, ලංකාවේ ආර්ථික ඉතිහාසය, ජාතික අධ්‍යාපන පදනම, 1997 පිටු 07.

29. එම පිටු 69.

30. එම පිටු 71.

31. ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය පිටු 108.

32. එම්.යූ.ද සිල්වා ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශය හා ජාතික ව්‍යාපාරය අභය මුද්‍රණ, කඩවත, 1996, පිටු 07.

33. රාජ්‍ය සහ ආගම, පිටු 104.

34. චන්ද්‍රාස අ. මැකීගිය අතීතය, ගොඩගේ සහෝදරයෝ, කොළඹ, 2001, පිටු 183.

35. De Silva K.M. The Rebelloin of 1848 in Ceylon C.J.H. 55 Vol 7 (2) July- Dec 1964.

36. De Silva K.M. (ed) Letters on Ceylon (1841-1860) 1965 P, 38.

37. ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍ය, පිටු 48.